මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- තත්ත්වාගණනය කළ මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානයකට අනුකූලව අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1හි38 ඡේදය අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අස්ථිත්වයට අඛණ්ඩව පැවතීමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් සිදු කළ යුතු අතර, සැලකිය යුතු තරම් සැක පහළ කෙරෙන සිද්ධීන් හෝ තත්ත්වයන්ට සම්බන්ධ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් හෙළිදරව් කළ යුතුවේ. එසේ වුවද වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල ඇවැර කර වසා දැමීමට අමාත්‍ය මණ්ඩල තීරණ, චක්‍රලේඛ සහ පනත් මගින් 2017 වර්ෂයේ සිට අවස්ථා 04 කදී දැනුම්දී තිබියදී එය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමකින් තොරව අඛණ්ඩ පැවැත්මක් සහිත අස්ථිත්වයක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.	මේ සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණ තවදුරටත් අරමුදල පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2023.01.31 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශය කටයුතු කර ඇත. එහිදී මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ 2023.03.14 දිනැති නිරීක්ෂණ සලකා බලා 2023.03.20 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අතිරේක ලේකම් මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර නිර්දේශ සඳහා යොමුකර ඇත. 2023.06.12 ඉදිරිපත් කළ සංදේශය මගින්, අරමුදලේ අඛණ්ඩ අවශ්‍යතාවය සම්බන්ධයෙන් කරුණු දක්වමින් පත් කළ විශේෂ කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. තවදුරටත් රේඛීය අමාත්‍යාංශය හා සම්බන්ධිත අමාත්‍යාංශ අරමුදලේ අවශ්‍යතාවය මත අඛණ්ඩව පවත්වාගෙන යාමට එකගතාවය එලකර ඉදිරි කටයුතු සිදුකර තිබිණි.	අරමුදල ඇවැර කර වසා දැමීමට අමාත්‍ය මණ්ඩල තීරණ, චක්‍රලේඛ සහ පනත් මගින් 2017 වර්ෂයේ සිට අවස්ථා 04 කදී දැනුම් දී ඇති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අස්ථිත්වයේ අඛණ්ඩ පැවත්ම පිළිබඳව සඳහන් කිරීමේදී ඒ බව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම.
(ආ)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් අරමුදල වෙත ලබාගෙන තිබුණු විදුලිය සහ ජලය සඳහා අරමුදලෙන් ගෙවිය යුතු අගය ගණනය කොට ගිණුම් ගත කර නොතිබුණු අතර, ඒ හේතුවෙන් ගිණුම් වර්ෂයට අදාළ එකී වියදම් ගිණුම සහ උපචිත වියදම් ගිණුම අවප්‍රමාණය වී තිබුණි.	පසුගිය වර්ෂයේ විගණන වාර්තාවට අනුව විදුලිය හා ජලය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමට නිවැරදි ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙසට නැවත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. නමුත් මේ වන තෙක් මෙම ගෙවීම් සිදු කිරීම පිළිබඳ නිවැරදි ක්‍රමවේදයක් සකස් කර නොමැති අතර, නැවත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ගෙවීම් සිදු කිරීමට කටයුතු කරමි.	වර්ෂයට අදාළ සියලු වියදම් නිසිපරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ කාර්යයන් වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සිව් දෙනකු පූර්ණ කාලීන සේවයේ යොදවා තිබූ නමුත් ඔවුන්ගේ සේවය වෙනුවෙන් ගෙවන ලද රු.3,648,181ක වැටුප් හා වේතන අරමුදලේ වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන්	පිළිගනිමි, ඉදිරියේදී අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.	වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම.

	වසරේ අතිරික්කය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.		
(ඈ)	2017 සිට වර්ෂ 08 ක් පුරා ඉදිරියට ගෙන එන පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු රු.1,096,875 ක මුදලක් නිරවුල් කිරීමේ හැකියාව සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත වායු විමෝචන උපකරණ ලබා දීම වෙනුවෙන් රඳවාගනු ලැබූ රු.1,096,875 ක මුදල එම පෞද්ගලික ආයතනය වෙත නොගෙවා රඳවා ගෙන තබා ගනු ලැබුවේ මෙම මුදල නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් වාර්තාව ලැබෙන තුරු වන අතර, මේ සම්බන්ධව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත දන්වා ඇති අතර ඉදිරියේදී අදාල වාර්තා ලබා ගෙන මෙම මුදල ගෙවා අවසන් කිරීමට කටයුතු කරමි .වාහන වායු විමෝචන භාරකාර අරමුදලින් ඉවත් වූ සේවකයෙකුට ගෙවිය යුතු රු.17,807 ක මුදල උපචිත වියදම් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරමි.	ඊළඟ වර්ෂයේ ගෙවීමට නියමිත නිශ්චිතව හඳුනා ගත හැකි වියදම් පමණක් ගිණුම් ගත කිරීම සහ මෙවැනි වෙන් කිරීම් ඇත්නම් ඒවා සමුච්චිත අරමුදලට ගැලපීම.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පිළියෙල කර තිබුණු එකතුව රු.171,437,319ක් වටිනා ජර්නල් සටහන් 61ක්, බලයලත් අනුමත කිරීමේ සහ සහතික කිරීමේ නිලධාරීන් විසින් අත්සන් කර නොතිබුණු අතර, එම ජර්නල් සටහන්වලට අදාලව ජර්නල් වවුචර් සහ උපකාරක ලියවිලි පවත්වා ගෙන ගොස් නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.	වර්ෂයට අදාළ ආදායම් සහ වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීම, ගිණුම් ගත කළ පසුව ජර්නල් සටහන් මගින් සිදු කරන වෙනස්කම්ද වවුචරයක් අනුමත කිරීම හා සමානව බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය සහ සහතික කිරීම මත සිදු කිරීම සහ ඊට අදාල උපකාරක ලියවිලි පවත්වා ගැනීම.
(ඊ)	පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු 2014 ජුනි 10 දින අරමුදල වෙත අයිතිය පවරා ඇති RANOMOTO වර්ගයේ යතුරුපැදිය ගිණුම්ගත කර නොතිබුණි.	BAY-9100 දරණ යතුරු පැදිය නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.	අරමුදල සතු ස්ථාවර වත්කම් සියල්ල ගිණුම්ගත කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීම.
(උ)	මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ශුද්ධ අගය ශුන්‍ය වී තිබුණු වත්කම් පන්ති 05ක, පිරිවැය හා සමුච්චිත ක්ෂයට රු.51,894,608ක අගයක් සමාලෝචිත වර්ෂයේදී එකතු කර තිබුණු අතර, එම අගය තහවුරු කර ගැනීම සඳහා වූ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	වායු විමෝචන භාරකාර අරමුලේ ශුද්ධ අගය ශුන්‍ය වී ඇති වත්කම් පන්ති 05ට අදාළ පිරිවැය හා සමුචිත ක්ෂයට එකතු කිරීමට අදාළ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ගොනුව නැවත යොමු කිරීමට කටයුතු කරමි.	අරමුදල සතු ස්ථාවර වත්කම්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂය ගිණුම්ගත කිරීම් සහ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීම්, අදාල මූලාශ්‍ර ලේඛන ඇතුළු තොරතුරුවලින් තහවුරු කිරීම.

1.5.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 හා 04 ඡේද ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1615/702/002-xvii හා 2017 අගෝස්තු මස 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය පරිදි, 2018 වර්ෂයේ දී වායු විමෝචන අරමුදල ඈවර කර වගකීම් පියවා වසා දැමිය යුතුවේ. එසේම 2017 දෙසැම්බර් 10 දිනැති අංක DMS/1143/VETF දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස පිහිටුවීමට යෝජිත වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය සඳහා තනතුරු 47 කින් යුතු සේවක සංඛ්‍යාවක් අනුමත කර තිබුණි. තවද 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය යටතේ මුදල් රෙගුලාසි 876(2) සහ (3) අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමටත්, ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් මෙම චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමටත් කටයුතු කළ යුතුවේ. 2024 අංක 44 දරන රාජ්‍ය මුදල් කළමනාකරණ පනතේ 39(4) වගන්තිය, 2024 නොවැම්බර් 06 දිනැති අංක 04/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2025 අප්‍රේල් 11 දිනැති අංක 1/2025 (අරමුදල්) දරන චක්‍රලේඛ ලිපිය අනුව, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 2025 අගෝස්තු 07 දිනට පෙර විසුරුවා හැරීම හෝ ඉදිරියට පවත්වා ගෙන යාම අවශ්‍ය වේ නම් භාණ්ඩාගාර ලේකම්වරයා විමසා මුදල් අමාත්‍යවරයා වෙත යොමු කළ යුතුවේ. 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව 2025 ජනවාරි 23 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ පවත්වා ඇති සාකච්ඡාවේදී සහ 2025 මාර්තු 25 දිනැති රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා	මේ සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණ තවදුරටත් අරමුදල පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2023.01.31 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශය කටයුතු කර ඇත. එහිදී මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ 2023.03.14 දිනැති නිරීක්ෂණ සලකා බලා 2023.03.20 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අතිරේක ලේකම් මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර නිර්දේශ සඳහා යොමුකර ඇත. 2023.06.12 ඉදිරිපත් කළ සංදේශය මගින්, අරමුදලේ අඛණ්ඩ අවශ්‍යතාවය සම්බන්ධයෙන් කරුණු දක්වමින් පත් කළ විශේෂ කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. තවදුරටත් රේගීය අමාත්‍යාංශය හා සම්බන්ධිත අමාත්‍යාංශ අරමුදලේ අවශ්‍යතාවය මත අඛණ්ඩව පවත්වාගෙන යාමට එකගතාවය එලකර ඉදිරි කටයුතු සිදුකර තිබිණි.	අදාල චක්‍රලේඛ විධිවිධාන සහ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ප්‍රකාරව මෙම අරමුදල අහෝසි කොට වසා දැමීමට හෝ තවදුරටත් පවත්වගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමටත් කටයුතු කිරීම.

ඇගැයීම් කමිටු රැස්වීම් තීරණය ප්‍රකාරවද වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල ඇවැර කිරීමට නිර්දේශ කර ඇත.

වායු විමෝචන අරමුදල ඇවර කිරීම සඳහා උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය, චක්‍රලේඛ විධිවිධාන සහ නිර්දේශයන් නිකුත් කර තිබියදීත්, 2018 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 07 කට ආසන්න කාලයක් ගතවී ඇතත් ව්‍යවස්ථාපිත නොවන මෙම අරමුදල පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමකින් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්, මුදල් අමාත්‍යාංශ හෝ භාණ්ඩාගාර අනුමැතියකින්ද තොරව රේඛීය අමාත්‍යවරයා මගින් අරමුදලේ අයවැය ලේඛන අනුමත කර ගනිමින් අරමුදල පවත්වාගෙන යාමට අරමුදලේ භාරකාර මණ්ඩලය කටයුතු කර තිබුණි.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව, යම්කිසි විශේෂිත කාර්යයක් සඳහා මණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවන නිලධාරීන් 16 දෙනෙකු වෙත අවස්ථා 147කදී එකතු වටිනාකම රු.5,617,720ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. එම කාර්යය නිම කළ විගසම අත්තිකාරම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරීන් තිදෙනෙකු වෙත අවස්ථා 03කදී ලබාදී තිබුණු රු.120,000ක මුදල් පියවා නොතිබුණු අතර, මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනකු අවස්ථා 27කදී ලබාගත් රු.1,133,510ක අත්තිකාරම් පියවීම සඳහා දින 21 සිට දින 91 දක්වා කාලයක් ගත කර තිබුණි.	අරමුදලේ පූර්ණ කාලීන මණ්ඩලික නිලධාරීන් එක් අයෙකු පමණක් ඇති බැවින් කාර්යය සිදු කිරීමේදී ගැටලු මතු වේ. එම නිසා වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය පරිදි මෙම නිලධාරීන් වෙත තත්කාර්යය සඳහා අතුරු අග්‍රිම නිකුත් කර ඇත. යම් යම් ප්‍රායෝගික හේතූන් මත සුළු ප්‍රමාදයන් සිදු ඇති වුවද ඒ සියල්ල පියවීමට කටයුතු කර ඇත. ඉදිරියේදී ලබා ගනු ලබන අත්තිකාරම් මුදල් හැකි ඉක්මණින් පියවීමට නැවතත් උපදෙස් ලබා දෙන ලදී.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම සහ මනා අභ්‍යන්තර පාලනයක් සඳහා අවශ්‍ය පිළිවෙත් නිශ්චය කිරීම.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.2 ඡේදය	සංචිත වාහන සඳහා කිලෝමීටර් 100කට වැඩි දුරක් රාජකාරී සඳහා ගමන් කිරීමට අවස්ථාව යෙදෙන විටෙකදී වාහනය පාවිච්චි කිරීමට අවසරලත් නිලධාරියා වෙත අත්තිකාරම් මුදලක් ලබා දී ඉන්ධන පිරවීම කළ යුතු වේ. එසේ වුවද වර්ෂය ආරම්භයේ මාණ්ඩලික නිලධාරියෙකු නොවන අධීක්ෂණ නිලධාරියෙකු වෙත රු.50,000ක අත්තිකාරමක් ලබාදී එම නිලධාරියා නමින් සමාලෝචිත වර්ෂය තුළ අරමුදල සතු වාහන 03 සඳහා එකතුව රු.991,154ක බිල්පත් ප්‍රතිපූරණය කරමින් ඉන්ධන පිරවීම සිදු කර තිබුණි.	දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පරීක්ෂාවන් සහ අහඹු වාහන දුම් පරීක්ෂාවන් සිදු කිරීම සඳහා දිවයින පුරා ගමන් කිරීමට සිදු වේ. එහිදී එක් වරක් ඉන්ධන ටැංකිය සම්පූර්ණ කලද අතිරික්ත ඉන්ධන අවශ්‍ය වේ. ගමන් කිරීමේ කාර්ය භාර නිළධාරියා ලෙස විටින් විට නම්කර එවනු ලබන මෝටර් රථ පරීක්ෂකවරයෙකුගේ සේවාව ලබා ගන්නා බැවින් ඉන්ධන ප්‍රතිපූර්ණය කිරීමේ කාර්යය ප්‍රායෝගික නොවන නිසා මේ ආකාරයෙන් කටයුතු කර ඇත.	වාහන සඳහා ඉන්ධන පිරවීම සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම, ඉන්ධන පිරවීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාදිය යුතු අවස්ථාවලදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම.
(ආ)	අංක පී.ඊ.ඩී 3/2015 දරණ 2015 ජූනි 17 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය	පාලක මණ්ඩලයට සහ ලේකම් තනතුරට දීමනා ගෙවීමට මෙම චක්‍රලේඛයේ නෛතික ප්‍රතිපාදන ඇතුළත්ව නොතිබියදී විධිමත් අනුමැතියකින් තොරව, 2022 දෙසැම්බර් 21 දින ලබාදී තිබුණු භාරකාර මණ්ඩල අනුමැතිය මත භාරකාර මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වන පාලක මණ්ඩලයේ එක් සාමාජිකයෙකුට රු.12,500ක් බැගින් සහ රැස්වීමේ රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් භාරකාර මණ්ඩලයේ ලේකම් තනතුර සඳහා රු.6,000ක් බැගින් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණු රැස්වීම් 03 ක් වෙනුවෙන් රු.205,500ක දීමනා ගෙවා තිබුණි.	වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයට අදාළ සියලු ගෙවීම් තීරණය කිරීමට හා සිදු කිරීමට බලය ඇති අතර ඒ අනුව මෙම ගෙවීම් සිදු කර ඇත. තවද වැඩිදුරටත් මේ සම්බන්ධයෙන් එවකට පැවති භාරකාර මණ්ඩලය රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් විමසන ලද අතර, ඒ අවස්ථාවේ දී රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව දන්වා ඇත්තේද භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයට ගෙවීම් සිදු කිරීමට බලය ඇති බවත්ය. ඒ අනුව ගෙවීම් කටයුතු සිදු කර ඇත.	චක්‍රලේඛ හෝ වෙනත් නීතිරීති රෙගුලාසි මගින් මෙම දීමනා අනුමත වී ඇත්නම් ගෙවීම් කටයුතු සිදු කිරීම.
(ඇ)	2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009/(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ	වර්ෂාවසාන දිනට වායු විමෝචන අරමුදලේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, වත්කම් කාණ්ඩ 47කට අදාලව වත්කම් ඒකක 213ක් අරමුදල සතුව ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම් ගත වී ඇති සියලු වත්කම් උක්ත සමීක්ෂණයන්ගෙන් තහවුරු වී ඇත්ද යන්න පරීක්ෂා	වාහන වායු විමෝචන වැඩසටහන ආරම්භයේ සිට 2024.12.31 දින දක්වා මිලදී ගනු ලැබූ භාණ්ඩ උපකරණ සමීක්ෂණ වාර්තා පොතට ඇතුළත් කර ඇත. ඒ අනුව ක්ෂය වූ වත්කම් ඉවත් කර 2024.12.31 දක්වා අදාළ	මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කෙරෙන අරමුදල සතු ස්ථාවර වත්කම්වල වටිනාකම් මූලාශ්‍ර ලේඛන සහ ස්ථාවර වත්කම් ලේඛන මගින් තහවුරු වන ලෙස අවශ්‍ය

	මුදල් රෙගුලාසි 502(2)	කිරීමට ප්‍රමාණවත් ගිණුම්කරණ සාක්ෂි පවත්වා ගෙන ගොස් නොතිබුණි.	වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශ තුළ ගිණුම් ගත කර ඇත. ස්ථාවර වත්කම් ලේඛණයක් පරිඝණක ආකෘති පත්‍රයක් භාවිතයෙන් අරමුදල ආරම්භයේ සිටම පවත්වාගෙන ගොස් ඇති අතර, මේ දක්වා විගණන විමසුම්වලට ලක්වී නොමැත. ඉදිරියේදී රජයේ ආකෘතිය අනුව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි.	ලේඛන සහ පොත්පත් පවත්වා ගෙන යාම.
(ඈ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 8 ඡේදය සහ මුදල් රෙගුලාසි 753(2)	අරමුදල විසින් එකතුව රු.114,237,646 ක් වූ ජංගම නොවන වත්කම් මිලදී ගෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළු ශාඛා කාර්යාල, මධ්‍යම පරිසර අධිකාරිය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත භෞතිකව පවරා දී තිබුණු නමුත්, මෙම චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එම වත්කම් නීත්‍යානුකූලව පවරා නොතිබුණි. එසේම මෙම වත්කම් නිවැරදිව භෞතිකව පවරා ඇති බව තහවුරු කිරීමට මුදල් රෙගුලාසි ප්‍රකාරව එම ආයතන වෙතින් 219 වැනි පොදු ආකෘතියෙන් ලැබීම් ඇණවුමක් හෝ ලබා ගෙන නොතිබුණි.	2020 අගෝස්තු 28 දිනැති අංක 2020/01 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 08 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව එම වත්කම් පැවරීමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ ආයතන වෙතින් 219 වෙනි පොදු ආකාතිය ලබා ගැනීමටත් කටයුතු කරමි. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සඳහා අදාල ආයතන භාවිතා කරන ආකෘතියෙන් ලැබීම් නියෝග ලැබී ඇති අතර රජයේ සාමාන්‍ය ක්‍රමවේදය යටතේ නිකුත් කිරීමේ නියෝග නිකුත් කර ඇත.	වෙනත් ආයතන වෙත පවරා දී ඇති ස්ථාවර වත්කම්, අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ලැබීම් නියෝග ලබා ගැනීමෙන් පසුව පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම.
(ඉ)	මුදල් රෙගුලාසි 1645 (අ)	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොතක් යාවත්කාලීනව පවත්වාගත යුතු වුවත්, වාහනය පිළිබඳ විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, සර්විස් කිරීම, ගමන් පිළිබඳ මාසික සාරාංශය වැනි තොරතුරු ඇතුළත් කර වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි.	මේ වන විට සියලු තොරතුරු යාවත්කාලීන කර ඇත.	මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කිරීම, වාහන ලොග්පොත්වල සියලු තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කිරීම.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.376,081,255 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.334,633,332 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.41,447,923 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යම් තනතුරකට අදාළව ගිවිසගත් වැටුපක් මත එකී තනතුරට අදාළ රැකියා විස්තරයේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතු වන අතර එකී කාර්යයන් සඳහා අමතර ගෙවීමක් හිමි නොවේ. එහෙත් රැකියා විස්තරයෙහි දූම් පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වැනි වායු විමෝචනයට අදාළ කාර්යයන් සිදුකිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති ව්‍යාපෘති සහකාර, පර්යේෂණ සහකාර හා කාර්මික ශිල්පීන් 11 දෙනෙකු වෙනුවෙන් රැකියා විස්තරය අනුව ඔවුන් සිදු කළ යුතු කාර්යයක් වන දූම් පරීක්ෂණ වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත පමණක් අරමුදලේ ව්‍යාපෘති සහකාර, පර්යේෂණ සහකාර නිලධාරීන්ට දිනකට රු.2,000 ක් බැගින් සහ කාර්මික ශිල්පීන්ට දිනකට රු.1,500 බැගින් සමාලෝචිත වර්ෂය තුළ සහභාගීත්ව දීමනා නමින් එකතුව රු.934,500 ක් ගෙවා තිබුණි.	වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ කාර්යාල මගින් මෙම දූම් පරීක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණය අහඹු දූම් පරීක්ෂණ කටයුතු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. දැනට සිටින නිලධාරීන් තාක්ෂණික සහකාර හා පර්යේෂණ සහකාර ලෙස බඳවා ගැනීම් සිදු කර ඇත. දූම් පරීක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණය, අහඹු දූම් පරීක්ෂණ කටයුතු සිදු කිරීමට අදාළ සියලු කටයුතු සැලසුම් කර සකස් කර සියලු වාර්තා ලබන්නේ මෙම නිලධාරීන්ය. මෙම නිලධාරීන් තමන්ගේ දෛනික කාර්යයට එහා ගිය රාජකාරියක් සිදු කරනු ලබයි. මේ තත්ත්වය තුළ සේවක හිඟය නිසා ගැටලු සහගත තත්ත්වයන් උදා වී ඇති අතර, වැඩිපුර කාර්යය ප්‍රමාණය ඉටුකර ගැනීම සහ මෙම කාර්යය සාර්ථකව අවසන් කිරීමට ධෛර්යය කිරීමක් ලෙස මෙම දීමනාව ගෙවනු ලබයි. භාරකාර ගිවිසුම අනුව අවශ්‍ය කාර්යය මණ්ඩලය පත්කිරීම හා දීමනා ගෙවීමට භාරකාර මණ්ඩලයෙහි අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇත.	විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම.
(ආ)	මුදල් අමාත්‍යාංශයේ හෝ අදාල වැටුප් බලධාරී ආයතන ව්‍යුහයන්ගේ අනුමැතියකින් තොරව, 2022 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අංක 2022/04 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට ලබාගත් භාරකාර මණ්ඩලයේ අනුමැතියක් මත පමණක් වායු විමෝචන වැඩසටහන් සඳහා සහභාගී කරවා ගනු ලබන මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්, කාර්මික විද්‍යාලවල නිලධාරීන් වැනි බාහිර රාජ්‍ය නිලධාරීන් සඳහා දිනකට රු.2,000 ක්ද, පොලිස් නිලධාරීන් සඳහා දිනකට රු.1,500 ක්ද, ක්ලීන්කෝ ලංකා සහ ලාෆ් එකෝ ශ්‍රී පුද්ගලික සමාගම්හි කාර්මික ශිල්පීන් සඳහා දිනකට රු.1,000 ක්ද බැගින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.2,246,200 ක සහභාගීත්ව දීමනාවක් ගෙවා තිබුණි.	භාරකාර ගිවිසුම අනුව අවශ්‍ය කාර්යය මණ්ඩලය පත්කිරීම හා දීමනා ගෙවීමට භාරකාර මණ්ඩලයෙහි අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇත. තවද දිස්ත්‍රික් මට්ටමින් මෙම කාර්යය සිදු කිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් දිස්ත්‍රික් මට්ටමින් විසිරී ඇති පරිසර නිලධාරීන් එකතු කරගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එම නිසා පසුගිය වසරෙහි වාහන 10,000 ක පමණ අහඹු දූම් පරීක්ෂණ කටයුතු සිදු කර ගැනීමට හැකි වී ඇත. තවද දිස්ත්‍රික් මට්ටමන් මෙම වැඩසටහන දියත් කිරීමට හැකි වී ඇත. තවද සියලුම පාර්ශවයින් සම්බන්ධ වීම හරහා වැඩසටහන පිළිබඳ පුළුල් ප්‍රචාරයන් සමාජ ගතවී ඇත.	විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම.

(ඇ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස පිහිටුවීමට යෝජිත වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය සඳහා 2017 දෙසැම්බර් 10 දිනැති අංක DMS/1143/VETF කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් තනතුරු නාම 12 ක් යටතේ තනතුරු 47 ක් අනුමත කර, එම තනතුරු සඳහා බඳවා ගැනීම් හා අනුයුක්ත කරවා ගැනීම්, අනුමත උසස් කිරීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව විධිමත්ව සිදු කළ යුතු බව දන්වා තිබුණු නමුත්, වායු විමෝචන අරමුදල යටතේ කාර්ය මණ්ඩල තනතුරු අනුමත කිරීමක් සිදු වී නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අරමුදල යටතේ තනතුරු සඳහා වැටුප් හා දීමනා ගෙවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් නොතිබියදී සහ විධිමත් සේවා ව්‍යවස්ථාවක්/බඳවා ගැනීමේ පරිපාටියකින් තොරව, අංශයක් ලෙස පිහිටුවීමට යෝජිත වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය සඳහා අනුමත තනතුරුවලින්ද බැහැර වෙනත් තනතුරුද ඇතුළත්ව සමාලෝචිත වර්ෂය තුළ අරමුදල යටතේ තනතුරු 24 කට එකතුව රු.14,925,950 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.	කාර්ය මණ්ඩලය සඳහා තනතුරු නාම සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළද, 10MT/02/01/01/02/11/II දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ සඳහන් පරිදි ව්‍යාපෘති කාර්යාලයේ වියදම් අරමුදල මගින් ආවරණය කරගත යුතු බව දන්වා ඇත. එබැවින් අරමුදල පිළිබඳ ප්‍රතිපත්තිමය තීන්දුව ලැබෙන තෙක් උක්ත අන්තර්ග්‍රහන සිදුකර නොහැකි බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග 2022.01.23 දින පැවැති සාකච්ඡාවේදී දන්වන ලදී. වායු විමෝචන අරමුදල ඇවර කිරීම හෝ සම්බන්ධයෙන් මේ වන තෙක් අවසන් තීරණයකට පැමිණ නොමැති අතර, ඒ සඳහා අදාල කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් මෙම කාර්යාලය මගින් වායු විමෝචන වැඩසටහනේ නියාමන කාර්යය සිදු කිරීම සඳහා වෙන්ව ඇති එකම ආයතනය වන බැවින්, වාහන වායු විමෝචන පරික්ෂණ ව්‍යාපෘති කාර්යාලයේ කාර්යයන් අනිකුත් සාමාන්‍ය රාජ්‍ය සේවයේ කාර්යයන්ට වැඩි විශේෂිත වු සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් මගින් ඉටුකර ගත ඇත. ඒ සඳහා කාර්ය මණ්ඩලය දෙස් විදෙස් පුහුණුව සඳහාද ලක් කර ඇත.	ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමත තනතුරු සඳහා පමණක් විධිමත් සේවා ව්‍යවස්ථාවක්/බඳවා ගැනීමේ පරිපාටියක් යටතේ නිලධරයන් බඳවා ගත යුතු අතර, එම තනතුරු සඳහා පමණක් වැටුප් දීමනා ගෙවීමට කටයුතු කිරීම.
(ii)	නිසි පත්කිරීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ වායු විමෝචන අරමුදලේ වැඩබලන තනතුරු 04 ක නිලධාරීන් 04 ක් වෙනුවෙන් එකතුව රු.1,775,875 ක වැඩබැලීමේ දීමනා, ප්‍රවාහන දීමනා හා සන්නිවේදන දීමනා ගෙවා තිබුණු අතර, වායු විමෝචන අංශය සඳහා අනුමත වී ඇති කාර්ය මණ්ඩලයෙන්ද පරිබාහිර තනතුරු 03 ක් සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු	වායු විමෝචන අරමුදල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අනුබද්ධව ස්ථාපිත කර ඇත. එහි පරිපාලන කටයුතු සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන් 03 දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් ඇත. දැනට එම කාර්යාලයේ කිසිදු මාණ්ඩලික නිලධාරින් නොමැති නිසා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් වැඩ බැලීම සිදුකරනු ලැබේ. ඒ අනුව එම වැඩ බැලීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ නිර්දේශය ඇත. දීමනා ගෙවීම සඳහා අවශ්‍ය නෛතික බලතල වායු විමෝචන භාරකාර මණ්ඩලයට ඇත.	යම් නිලධරයෙකුට වැඩ බැලීමේ වැටුපක් ගෙවීමට, අදාල නිලධරයාගේ පත්වීම් බලධරයා විසින් එම වැඩබැලීමේ තනතුර සඳහා පත්කර තිබීම.

	නිලධාරීන් තිදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.902,622 ක වැඩ බැලීමේ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.		
(iii)			
(iv)	2017 දෙසැම්බර් 10 දිනැති අංක DMS/1143/VETF කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් වායු විමෝචන අංශය සඳහා අනුමත අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ තනතුරක් වන නමුත් ඊට සුදුසු නිලධාරියෙකු අනුයුක්ත කිරීමකින් තොරව, ඉහත ඇ(ii) හි ඇතුළත් වැඩ බැලීමේ තනතුරක් වන අධ්‍යක්ෂ තනතුරට ආදේශ කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරියෙකු බඳවා ගෙන එකී නිලධාරියා වෙත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ තනතුරට අදාල එකතුව රු.113,280 ක වැඩ බැලීමේ වැටුප් හා III ශ්‍රේණියේ නිලධාරියෙකුට හිමි නොවන රු.1,162,410 ක ඉන්ධන හා ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.	පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ තනතුර සඳහා 2018 සිට මේ දක්වා සෑම වසරකම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් දැන්වීම පළකර ඇත. නමුත් ව්‍යාපෘති කාර්යාලය උක්ත තනතුරු පූර්ණ රාජ්‍ය සේවයට මේ වන තෙක් අන්තර්ග්‍රහණය කර නොමැති බැවින් සෘජුවම රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ට මෙම තනතුරු සඳහා ඇතුළත් විය නොහැක. ඒ වෙනුවට ද්විතියීක හෝ අර්ධ කාලීනව වැඩ බැලීම පදනම මත පමණක් ඇතුළත් විය හැක. එබැවින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පූර්ණ කාලීන සේවයේ නියුතු ඉංජිනේරු සේවයේ 2වන ශ්‍රේණියේ නිලධාරියෙකු භාරකාර ප්‍රතිපාදන ප්‍රකාරව භාරකාර මණ්ඩල අනුමැතිය මත පත්කර ඇත. ඒ සඳහා කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශය, ප්‍රවාහන ලේකම්ගේ එකඟතාවය මත අමාත්‍යාංශ ලේකම්වරයාද සාමාජිකයෙකු වන භාරකාර මණ්ඩලය විසින් විධිමත් පරිදි පත්කර අදාල දීමනා ගෙවීම් සිදුකරනු ලබයි.	වැඩ බැලීමේ තනතුරු සඳහා පත්කිරීම් සහ දීමනා ගෙවීම් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සිදු කිරීම
(ඇ)	මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂ අවසාන දිනට සමුච්චිත වී ඇති ලාභය රු.මිලියන 983.002 ක් වන නමුත් එකී සමුච්චිත ලාභය ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමකින් තොරව ස්ථාවර තැන්පතුවල සහ ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	වාහන වායු විමෝචන භාරකාර අරමුදල ස්ථාපිත කර ඇත්තේ සමස්ථ වායු දූෂණය අවම කිරීමේ අරමුණින් වේ. භාරකාර ගිවිසුමේ අරමුදල් රැස්කිරීම හා වියදම් කිරීම දක්වා ඇත. ඒ අනුව අරමුදල් ඒකාබද්ධ අරමුදල හර කිරීමට නොවන අතර, වායු විමෝචන කටයුතු සම්බන්ධයෙන් රැස්කිරීමක් වේ. අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට ලබාදීමේ අවශ්‍යතාවක් නොමැති අතර, ආයෝජන කිරීමට ප්‍රතිපාදන ඇත. නමුත් අරමුදලේ අතිරික්ත මුදල් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි.	අතිරික්ත මුදල් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත ආයෝජනය කිරීම හෝ රාජ්‍ය මුදල් නිසි පරිදි ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කිරීම.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වායු විමෝචන පරීක්ෂා සිදුකරනු ලබන පෞද්ගලික සමාගම් දෙක සමඟ ඇති ගිවිසුම් ප්‍රකාරව එක් එක් වාහනය සඳහා අය කරන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 10 ක් වායු විමෝචන අරමුදල වෙත ගෙවිය යුතු වේ. එහෙත් එම පෞද්ගලික සමාගම් සිදුකරන ලද දූම් පරීක්ෂණ සංඛ්‍යාව, ඒ වෙනුවෙන් ඔවුන් අය කරගෙන ඇති පරීක්ෂණ ගාස්තු සහ ඒ අනුව වායු විමෝචන අරමුදල වෙත ලැබිය යුතු ආදායම් පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදයක් සම්බන්ධයෙන් ගිවිසුම්ගත එකඟතාවයකින් තොරව එම පෞද්ගලික සමාගම් මගින් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව රු.මිලියන 363.85 ක් අරමුදලේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. මේ හේතුවෙන් දූම් පරීක්ෂණ මගින් රජයට ලැබිය යුතු සියළු ආදායම් නිසිලෙස ලැබුණේ ද, ලැබිය යුතු ආදායම් කොපමණද යන්න නිවැරදිව තහවුරු කර ගැනීමකින් තොරව, උක්ත පෞද්ගලික සමාගම් ප්‍රේෂණය කළ ආදායම අරමුදලේ සත්‍ය ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.	මෙම දූම් පරීක්ෂණ වැඩසටහන Built own operate ක්‍රමවේදය යටතේ ටෙන්ඩර් කිරීම් සිදු කර ඇත. ඒ අනුව පිරිවැය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධ සියලු කටයුතු සිදු කරනු ලබන්නේ කොන්ත්‍රාත් ආයතන දෙක මගින් වන අතර, රජය මගින් කිසිදු වැය බරක් නොදරයි. ඒ අනුව ඔවුන් විසින් දූම් පරීක්ෂණ දත්ත ගබඩා පවත්වාගෙන යනු ලබයි. දූම් පරීක්ෂණ දත්ත ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා මධ්‍යම දත්ත ගබඩාවක් වන ICTA දත්ත ගබඩාවට කොන්ත්‍රාත් ආයතන මගින් දූම් පරීක්ෂණ දත්ත සම්ප්‍රේෂණය කරයි. ඒ අනුව දූම් පරීක්ෂණ ක්‍රමවේදයේ සියලු මෙහෙයුම් කටයුතු සිදු කිරීම කොන්ත්‍රාත් ආයතන මගින් සිදු කිරීමටත් මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට අප වෙත පහසුකම් ලබාදීමත් කොන්ත්‍රාත් ගිවිසුම අනුව එකඟ වී ඇත. ඒ අනුව කොන්ත්‍රාත් අයතන දෙකෙහි දත්ත පද්ධතීය වෙත ප්‍රවේශ වී දූම් පරීක්ෂණ දත්ත නිරීක්ෂණය කිරීමට අප වෙත පහසුකම් ලබාදී ඇත. ඒ අනුව අප විසින් මෙම දත්ත පද්ධතියට පිවිස අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.	ආදායම නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කිරීම.

3.3 කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වායු තත්ත්ව කළමනාකරණය සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට සහ ඒවා මහජනතාවට ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් වායු විමෝචන අරමුදල විසින් මිලදී ගෙන තිබුණු එකතුව රු.82,752,000ක් පිරිවැය වන වායු තත්ත්ව මැනීමේ උපකරණ 02ක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත සහ එකතු පිරිවැය රු.78,068,892ක් වූ ජංගම වායු තත්ත්ව මැනීමේ උපකරණ 02 ක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරා දී තිබුණි. එම දත්ත භාවිතයෙන් සිදු කළ යුතු කාර්යයන් පිළිබඳව අරමුදල සතුව පූර්ව නිශ්චිත වැඩපිළිවෙලක්	වායු විමෝචන භාරකාර අරමුදලට ස්ථාපිත කර ඇත්තේ වායු දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට විද්‍යාත්මක මට්ටමේ වායු තත්වයන් මැනීමේ උපකරණ මිලදී ගැනීමට හා එවා තිරසාරව නඩත්තු කිරීමට රජයට අමතර පිරිවැයක් දැරීමට නොදී මෙම අරමුදල මගින් මුදල් ප්‍රතිපාදන වැය කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව වායු තත්වයන් පිළිබඳ නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණවලට එළඹීම සඳහා වායුවේ ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු ලබාගැනීමට මධ්‍යම පරිසර අධිකාරියට හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අනුව අරමුදල විසින් ලබාදී ඇති උපකරණ හා අනෙකුත් තාක්ෂණික	වත්කම් නිෂ්කාර්ය නොවන ලෙස උපයෝජනය කිරීම

නොමැති වීම, යන්ත්‍ර සවි කර ඇති අවට වායු තත්ත්වයේ ගුණාත්මක තත්ත්වය පමණක් මැනිය හැකි වීම, එකී මිනුම් දත්ත භාවිතා කර සමස්ත වායු තත්ත්වය කළමනාකරණය වෙනුවෙන් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් අරමුදල විසින් සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 160කට අධික රජයේ මුදල් වැය කර මෙම උපකරණ මිලදී ගැනීම මගින් ලබාගෙන ඇති මිනුම් දත්ත නිෂ්කාර්ය බව නිරීක්ෂණය විය.

ක්‍රම ඔස්සේ මිනුම් කරනු ලබන සියළුම වායු ගුණදත්ත එම දත්තයන් පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව වෙත ලබා ගැනීම සඳහාත්, මහජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහාත් අවශ්‍ය මෘදුකාංගය මේ වන විට අදාල ආයතන දෙක විසින් සකස් කරමින් පවතී.

තවද, AIR QUALITY INDEX එකක් සාදා ඇති අතර, අවට වායු තත්වයේ ගුණාත්මක තත්වය එමගින් ප්‍රදර්ශනය කරනු ලබයි .තවද මෙම ඒකක මගින් ලබා ගන්නා ලද දත්ත, එම දත්තයන් පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව වෙත ලබා ගැනීම සඳහාත්, මහජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහත් මධ්‍යම පරිසර අධිකාරියේ හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිවල දක්වා ඇත. ඊට අමතරව, මෙම දත්ත පරිසර අමාත්‍යාංශයේ වායු තත්ව කළමනාකරණ කේන්ද්‍රය මගින් වායු තත්ත්ව කළමනාකරණය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහාත් යොදා ගැනීමට යොමු කර ඇති බව දන්වමි.